**<u>පාලින්දනුවර ප්‍රාදේශීය සභාව</u>**
**<u>කළුතර දිස්ත්‍රික්කය</u>**

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 25 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 01 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 16 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **<u>මතය</u>**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැටුප් ගිණුමේ රු.52,995 ක් වූ අඩුකිරීම් වෙනත් ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ වැඩියෙන් සටහන් කර තිබූ වැටුප් ප්‍රතිපූර්ණ ආදායම රු.306,804 ක් සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමේදී රු.385,063 ක් ලෙස ගිණුම් තැබීම නිසා සමුච්චිත අරමුදල රු.78,259 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ ආදායම ගණනය කිරීමේදී ආරම්භක ශේෂය රු.70,000 ක් හා අවසාන ශේෂය රු.20,000 ක් ආදායමට ගැලපීම් කර නොතිබීම නිසාත් සභික දීමනා ආරම්භක ශේෂය රු.301,000 ක් හා අවසාන ශේෂය රු.153,000 ක් ගැලපීම් කර නොතිබීම නිසාත් සමාලෝචිත වර්ෂයේ වෙනත් ආධාර ආදායම් රු.198,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) රු.78,000 ක් වූ බෝට්ටු 2 ක් ප්‍රාග්ධනගත කිරීමේදී මෝටර් රථ හා කරත්ත ගිණුමට ගිණුම් ගත කිරීම වෙනුවට කර්මාන්ත ගබඩා තොග ගිණුමට ගිණුම් ගත කර තිබුණි.

(ඉ) එකතු කළ අගය මත බදු ගිණුමේ ශේෂය කපාහැරීමේදී රු.192,290 ක් සමුච්චිත අරමුදල් ගිණුමට සටහන් කිරීම වෙනුවට අවිනිශ්චිත ගිණුමට සටහන් කර තිබුණි.

(ඊ) අකුණු සන්නායක යන්ත්‍රයේ වටිනාකම රු.85,000 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.

(උ) ඉකුත් වර්ෂයේ පොල බදු තැන්පත් රු.159,583 ක් සමාලෝචිත වර්ෂයේදී ආදායමට ගෙන තිබුණද තැන්පත් ගිණුමට ගිණුම් ගත කර නොතිබීම නිසා එම වටිනාකමින් තැන්පත් ශේෂය වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) ලෙජර ගිණුම අනුව වියදම් ණයහිමි ගිණුමේ ශේෂය රු.6,408,043 ක් වුවද ශේෂ පත්‍රයට එම වටිනාකම රු.6,337,873 ක් ලෙස ගෙන තිබීම නිසා ණයහිමි ශේෂය රු.70,170 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) ලෙජර ගිනුම අනුව රු.102,303,790 ක් වූ කර්මාන්ත ආධාර බිල් කිරීම් හා කර්මාන්ත වැය, ආදායම් හා වියදම් ගිණුමට සටහන් නොකර එකිනෙකට හිලව් කර තිබුණි.

(ඒ) කර්මාන්ත ලේඛණයට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ආදායම් ආධාර ණයගැති ශේෂය රු.44,751,069 ක් වුවද ලෙජර් ගිණුම අනුව එම ශේෂය රු.58,661,040 ක් වීම නිසා රු.13,909,971 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඔ) කර්මාන්ත ලේඛණයට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රජයේ ආධාර ණයහිමි ගිණුමේ ශේෂය රු.44,751,069 ක් වුවද ලෙජර් ගිණුමට අනුව එම ශේෂය රු.68,737,546 ක් වීම නිසා රු.23,986,477 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

(අ) 2014 ජනවාරි 01 දිනට ලීබඩු හා උපකරණ රු.1,126,944 ක්, මෝටර් රථ හා කරත්ත රු.3,088,350 ක්, යන්ත්‍ර හා උපකරණ රු.3,488,243 ක් වශයෙන් දක්වා තිබූ එකතුව රු.7,703,537 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් විගණනයට ලබා ගත නොහැකි විය.

(ආ) සමලෝචිත වර්ෂය අවසානයේ රු.3,114,077 ක් වූ වියදම් ණයහිමි ශේෂයට අදාල කේවල ශේෂ දැක්වෙන උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදයම රු.6,051,193 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදයම රු.1,388,534 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා/ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) චෙක්පත් මගින් කෙරෙන සියළුම ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත්දැයි ගෙවන නිලධාරියා විසින් සොයා බැලිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ සෑම මාසයකම මුදල් පොතේ අයිරා ශේෂයක් ඇති වන පරිදි චෙක්පත් නිකුත් කර තිබුණි.

(ආ) 1997 සිට 2012 දක්වා කාලයට අදාල එකතුව රු.389,267 ක් වූ තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 2,161 | 1,948 | 376 |
| (ii) බදු කුලී | 4,080 | 3,848 | 439 |
| (iii) බලපත්‍ර ගාස්තු | 178 | 178 | -- |

2.3.2 **කඩකාමර බදුදීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** පොළ භූමියේ (දෙවන අදියර ) කඩ කාමර වෙන් කරවාගැනිමට 2009 දෙසැම්බර් 11 දින ටෙන්ඩර් කැඳවා තිබුණි. සභාවේ අනුමත ලන්සු මුදල වූ රු 825,000 ඉක්මවා නෙතිබීම නිසා කඩ

කාමර 03 ක් සඳහා ලැබී තිබූ ටෙන්ඩර් ප්‍රතික්ෂේප වී තිබුණි.එසේ ප්‍රතික්ෂේප වී තිබූ කඩ කාමර ටෙන්ඩර්, දින 07 ක් ඇතුළත ප්‍රාදේශිය මට්ටමින් ප්‍රසිද්ධ කර නැවත ටෙන්ඩර් කිරීමට තිරණය කර තිබුණ ද එසේ සිදුනොකර 2010 දෙසැම්බර් 15 දින පැවති මහා සභා රැස්මේදී මාසික කුලී පදනම මත බදු දී තිබුණි.

(ආ) 2013 මැයි 28 දින පැවති මහ සභා රැස්වීම් තීරණය අනුව ඉන් එක් කඩ කාමරයක් නැවත වෙනත්පුද්ගලයෙකුට 2014 ජනවාරි 02 දින සිට බදු දී තිබුණද ගිවිසුම් ප්‍රකාරව තැන්පත් ලෙස අය කළ යුතු මාස 03 ක කුලී මුදල විගණිත දිනය වූ 2015 ජුනි 15 වන විටත් අයකරගෙන නොතිබුණි.

(ඇ) කඩකාමර වෙනත් අයෙකුට පැවරීමේදී පැවරුම් ගාස්තු වශයෙන් රු.75,000 ක් සභාවට ගෙවිය යුතු බවට මහා සභාවේ තීරණය කර තිබුණද විගණිත දිනය වූ 2015 ජුනි 15 වන විටත් එකී බදුකරුගෙන් ගාස්තු අයකර නොතිබුණි.

2.3.3 **<u>ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලයේ අනුමත ආයතනවලින් බලපත්‍ර ගාස්තු අය කර ගැනීම</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය ප්‍රකාරව 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ ලියාපදිංචි වී ඇති හෝටල්, ආපන ශාලා ආදියෙන් සියයට 1 ක බදු මුදලක් අයකර ගත යුතු වුවත් 2006 වර්ෂයේ සිට නිවාඩු නිකේතනයකින් බදු මුදල් අය කර ගෙන නොතිබුණි.

2.3.4 **<u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 3,965,734 |
| (ii) | මුද්දර ගාස්තු | 5,752,922 |

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1 **<u>මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

(අ) **<u>සේවක ඇප</u>**

පළාත් පාලන කොමසාරිස්ගේ 2004 ජුනි 09 දිනැති අංක LG/05/2004 දරන චක්‍රලේඛයේ 02 ඡේදය අනුව හා 1992 ජනවාරි 29 දිනැති අංක 3/4/1 දරන බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ ලිපිය ප්‍රකාරව සභාවේ ඇප තැබිය යුතු සේවකයින් 21 දෙනෙකුගෙන් ඇප ලබාගෙන නොතිබුණි.

(ආ) **<u>නිල ඇඳුම් දීමනා ගෙවීම</u>**

සමාලෝචිත වර්ෂයේ සභාවේ සේවකයින් 45 දෙනෙකු සඳහා 2013 සහ 2014 වර්ෂ සඳහා නිල ඇඳුම් දීමනා ලෙස රු.360,000 ක් ගෙවා තිබුණද නිල ඇඳුම් පැළඳ සිටියේ නිලධාරීන් 08 දෙනෙකු පමණක් බව 2015 ජුනි 15 දින විගණන අවස්ථාවේ නිරීක්ෂණය විය.

(ඇ) **<u>දඩ මුදල්</u>**

2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාල සීමාව තුළ ආහාර සාම්පල් සම්බන්ධයෙන් පවරා තිබූ නඩු සඳහා දඩ ලෙස අධිකරණය විසින් අය කර තිබූ රු.69,000 ක මුදලකින් සභාවට ලැබිය යුතු සියයට 75 ක ප්‍රමාණය වූ රු.51,750 ක මුදල විගණිත දිනය වූ 2015 ජුනි 08 වන විටත් ගෙන්වා ගෙන නොතිබුණි.

3.2 **<u>කොන්ත්‍රාත් පරිපාලනය</u>**

දොරින් දොරට ගමින් ගමට පළාත් නැගුම සංවර්ධන වැඩසටහන -2014 යටතේ බදුරලිය වොලිබෝල් ක්‍රීඩා පිටිය රු.1,461,678 ක ඇස්තමේන්තුවක් යටතේ සංවර්ධනය කර තිබුණි.

ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 13 ප්‍රකාරව ක්‍රීඩාංගණය සඳහා උසස් තත්වයේ විදුලි ලාම්පු 08 ක් සපයා සවිකිරීම වෙනුවෙන් රු.280,000 ක් ඇස්තමේන්තු කර අවසාන ගෙවීම් වාර්තාව අනුවද අදාල මුදලම ගෙවා තිබුණි. බල්බ් 03 ක් සහිත ලාම්පු 04 ක් හා Flasher 04 ක් සවි කර තිබූ බව 2015 ජූනි 15 දින කරන ලද භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

3.3 **හඳුනාගත් අලාභ**

2014 නොවැම්බර් මාසයේදි දිවි නැගුම දෙපාර්තමේන්තුව මගින් සභාවේ ඉල්ලීමකින් තොරව GI බට 720 ක් ලබා දී තිබූ අතර එම බටවලින් වලල්ලාවිට ප්‍රාදේශීය සභාවට හා අගලවත්ත ප්‍රාදේශීය සභාවට පිළිවෙලින් බට 210 ක් හා 128 ක් ලබාදී තිබුණි. විගණිත දිනය වූ 2015 අප්‍රේල් 07 දින වන විට බට 118 ක් පමණක් පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ තිබුණි.

4. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වියදම් පාලනය

(ඈ) වත්කම් කළමනාකරණය